# කැලණිය අධ්‍යාපන කලාපය

# දෙවන වාර ඇගයීම - 2018

ශ්‍රේණිය - 11 විෂයය- නැටුම්(දේශීය) පත්‍රය- II පැය- 02

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු වැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

1. සියළුම ප්‍රශ්න වලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.

I) මුල්ම සිංහල ප්‍රශස්ති කාව්‍යය ලෙස .................................... පිළිගනු ලබයි.

II) කොහොඹා කංකාරියේ නර්තනයේ යෙදෙන්නන්.................................... ලෙස හඳුන්වයි.

III) ශාන්ති කර්ම වලින් බැහැර වූ ශාස්ත්‍රීය නර්තන අංගයක් ලෙස ................... හැඳින්විය හැකිය.

IV) කෝළම් රඟ මඩල.....................................නමින් හඳුන්වයි.

V) දොං දොං ජිං ජිං ගජිගත බෙර පදයේ තාල රූපය........................................වේ.

VI) සොකරි නාටකය රඟ දැක්වීමේ දී මහනුවර ප්‍රදේශයේ ...................වාද්‍ය භාණ්ඩය ලෙස යොදා ගනී.

VII) දෙවොල් මඩු ශාන්ති කර්මයේ දි දේවාභරණ තැන්පත් කරනුයේ.........................මතය.

VIII) සිරුරේ උපාංග කොටස් මගින් කෙරෙන අදහස් ප්‍රකාශනය ...................... අභිනය යනුවෙන් හැඳින්වේ.

IX) ආගමික කටයුතු සඳහා දේශීය වාද්‍ය භාණ්ඩය භාවිතා වන වාදන අවස්ථා දෙක නම් කරන්න.

(අ)...............................................

(ආ). ............................................

X) නර්තනයේ ප්‍රවර්ධනයට දායක වූ ප්‍රවීන නර්තන ශිල්පිනියන් දෙදෙනෙකු ලියන්න.

(අ). ..................................................

(ආ)................................................... (ලකුණු 12)

2. මාත්‍රා 4+4 ට බෙර පදයක් ප්‍රස්ථාර ගත කරන්න. (ලකුණු 02)
මාත්‍රා 2+3ට දෙතිතට අයත් ප්‍රශස්තියක පළමු පද පේළිය ප්‍රස්ථාර ගත කරන්න. (ලකුණු 04)
මාත්‍රා 2+4 දෙතිතට අයත් වන්නමක අඩව්ව ප්‍රස්ථාර කරන්න. (ලකුණු 06)

3. පහත සඳහන් මාතෘකා අතුරෙන් තුනක් කෙටියෙන් විස්තර කරන්න.

I. තුන් තිතේ ප්‍රභේද  II. වට්ටම්  III. ග්‍රහ පන්ති

Iv . අංග රචනය  v. සරඹ  (ලකුණු 4×3)

4. ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායයන් හා සබැඳි ශාන්ති කර්මවල සුවිශේෂ ලක්ෂණ තුලනාත්මකව දැක්විය හැකිය.

I.ශාන්ති කර්ම ත්‍රිත්වය පැවැත්වීමේ අරමුණු 02ක් නම් කරන්න. (ලකුණු 02)

II.කොහොඹා කංකාරිය හෝ දෙවොල් මඩුව ශාන්ති කර්මයේ එන රංග භාණ්ඩ දෙකක් කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 04)

III.පුරා වෘත්ත කථා පුවත් තුළින් සමාජයට ලබා දෙන යහපත් ආකල්ප විස්තර කරන්න.

(ලකුණු 06)

5. I.සොකරි හා කෝලම් නාටකවල එන ප්‍රදේශ 02 බැගින් නම් කරන්න. (ලකුණු 02)

II.සොකරි හා කෝලම් නාටක චරිත 02 විස්තරාත්මකව දක්වන්න. (ලකුණු 04)

III.ගැමි නාටක සංරක්ෂණය කිරීම සඳහා ඔබ විසින් කරන යෝජනා 02ක් විස්තර කරන්න.

(ලකුණු 06)

6. පහත රූප රාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(I).A හා B රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදායන් දෙක නම්කරන්න. (ලකුණු 02)

(II).A රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදායේ ගායනය සහිත හා රහිත නර්තන අංගය බැගින් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(III).B රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදායේ රංග වස්ත්‍රාභරණ පිළිබඳ විමසීමක් කරන්න.

(ලකුණු 06)

7. පහත සඳහන් කරුණු නර්තන කලාවේ නූතන ප්‍රවණතා කෙරෙහි බලපා ඇති ආකාරය විස්තර කරන්න.

(I) . නර්තන ප්‍රසංගයන්හි භාවිත නවීන තාක්ෂණික උපක්‍රම 2ක් නම්කරන්න. (ලකුණු 02)

(II). ශ්‍රී ලාංකික නර්තන ශිල්පීන් අන්තර් ජාතික තලයට පිවිසීම. (ලකුණු 04)

(III).අධ්‍යාපනික වශයෙන් නර්තන කලාවේ සිදු වූ වටිනාකම (ලකුණු 06)